# ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි හා විශ්වාස පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

ටී.එස්. මාටින්

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

thushanimartin47@gmail.com

ප්‍රමුඛ පදඃඇදිහිලි හා විශ්වාස, මැණික් කර්මාන්තය, අදෘශ්‍යමාන බලවේගය, වානිජ ව්‍යාපාරය,ඛණිජ සම්පත

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ වැදගත් ස්ථානයක් හිමිවන කර්මාන්තයක් ලෙස මැණික් කර්මාන්තය හඳුන්වාදිය හැකිය. දුරාතීතයක සිට පැවතියා වූ මැණික් කර්මාන්තය වර්තමානය වන විට ලංකාවේ ප්‍රධාන වානිජ ව්‍යාපාරයක් බවට ද පත්ව ඇත. ඒ අනුව මෙම කර්මාන්තය හා සබැඳි ඇදහිලි හා විශ්වාස ඉතිහාසය තුළින් විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම වැදගත්ය. මිනිස් ජීවිතයේ බුද්ධි මහිමය විදහා දැක්වෙන කැඩපතේ එක් පැතිකඩක් ලෙස මෙම ඇදහිලි හා විශ්වාස සැලකිය හැකිය. මෙම සංකල්පයන්හි මූලබීජය කවදා කොතනක දී ඇතිවූවා ද යන්න ගැටළු සහගතය. එය එතරම්ම පෞරාණික සංස්කෘතික උරුමයකි. කඳුවැටි අතර පිහිටන නිම්නවල, වගුරුබිම් සහිත තැනිතලාවල, ගංගා මිටියාවත්වල, කුඹුරු යායවල පිහිටන්නා වූ මැණික්, පොළොව අභ්‍යන්තරයෙන්, පොළොව මතුපිටට රැගෙන ඒම සඳහා පතල්කරුවෝ ඉමහත් පරිශ්‍රමයක් දරණු ලැබේ. පතල් කැපීම, මැණික් ගැරීම හිතුමතේට කළහැකි ක්‍රියාවක් නොවේ. එය ඉතාම අවදානම් සහගතය. එනිසාම පතල් කර්මාන්තය සමඟ බැඳී ඇදහිලි හා විශ්වාස රාශියක් පවතී. මිනිස් ශ්‍රමය මූලික කරගත් කර්මාන්තයක් වන නිසා එම අභෞතිකවාදී දෑ පිළිබඳව ඔවුන් විශ්වාස කරයි. මෙම ඇදහිලි හා විශ්වාස දායාද වූයේ පාරම්පරිකවය. මානව සමාජයේ පැවැත්ම ඇති වූ දා සිටම යම්කිසි කාර්යයක නියලීමේ දී එය සාර්ථක කරගැනීමට ඇදහිලි හා විශ්වාස රාශියක් පවතින බව ද පෙනේ. මෙහි දී ඔවුන්ගේ සිත්සතන් තුළ එල්බගෙන ඇති අදෘශ්‍යමාන බලවේග කෙරෙහි ඇති බැඳීම් හා විශ්වාස ප්‍රබල ව දිස්වේ. දෙවිදේවතාවුන්, යක්ෂයන්, ප්‍රේතයන්, භූතයන් ආදී අදෘශ්‍යමාන බලවේගයන් ඇදහීම හා ඔවුන් අරඹයා පුදපෙත් ලබාදීම මැණික් කර්මාන්තය තුළ දී සිදුවේ. මෙලෙස ඔවුන් සතුටු කිරීම තුළින් තම අභිප්‍රේත අරමුණු ඉටුකරගත හැකි බවට අතීතයේ සිටම මිනිසුන් විශ්වාස කර ඇත. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටළුව වන්නේ අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාවේ පැවතියා වූ මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි හා විශ්වාස වර්තමානයේ ද එලෙසින් ම පවතිනවා ද යන්න පිළිබඳවඅධ්‍යයනය කිරීම මෙන් ම වර්තමානය වන විට වානිජ ව්‍යාපාරයක් බවට පත්ව ඇති මැණික් කර්මාන්තයේ මෙම අභිචාරවල නව ප්‍රවණතා අධ්‍යයනය කිරීම ද වේ.

## ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි හා විශ්වාස පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදුකිරීමේ දී භාවිත කරන ලද පළමු ක්‍රමවේදය වූයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අන්තර්ගතවන පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය වේ. එහි දී පුස්තකාල ක්‍රමවේදය යටතේ පොත්පත්, ලිපි ලේඛන මෙන් ම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත්ව ඇති පෞරාණික හා කාලීන ලේඛන ද අධ්‍යයන කරනු ලැබීය. එසේ ම දෙවැනිව ක්ෂේත්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ තෙමාසික ක්ෂේත්‍ර පර්යේෂණයක් සබරගමු පළාතේ පැල්මඩුල්ල, රත්නපුරය හා ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇසුරින් සිදුකරන ලදි. එහි දී තෝරාගත් ඉලක්කගත පුද්ගලයන් හා ඉලක්කගත කණ්ඩායම්ගේ සහභාගීත්වයෙන්, සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ කරුණු එක්තැන් කරන ලදි.

## සාකච්ඡාව, ප්‍රතිඵල සහ නිගමන

මෙම පර්යේෂණයට අනුව ශ්‍රී ලංකාවේ මැණික් සම්පත දුරාතීතයට උරුමකම් කියන්නා වූ ඓතිහාසික වටිනාකමක් ඇති ඛණිජ සම්පතකි. අතීත මුතුන්මිත්තන් සුභ කර්තව්‍යයක් කිරීමට පෙර දෙවි කෙනෙකු ඉදිරියට ගොස් භාරයක් වීම දක්නට ලැබේ. ඒ අනුව මෙම ඇදහිලි විශ්වාස ක්‍රමය **දෙවියන් උදෙසා භාරවීම** නම් වේ. මැණික් කර්මාන්තයේ දී මෙම භාරවීම සුලභව දක්නට වන චාරිත්‍රයකි. මෙහි දී සමන් දෙවියන්ට, කතරගම දෙවියන්ට පඬුරු ගැටගැසීම කරන අතර මහා සමන් දේවාලය වෙතට යන පතල්කරුවන් තමාගේ පතලේ කාර්යය සාර්ථක කරදෙන ලෙස ඉල්ලා භාරවීම කරනු ලැබීය. තව ද ඉල්ලම් ගැරීමේ දී මැණික් හමුනොවේ නම්, හමු වූ මැණික්වලට නියම වටිනාකමක් නොලැබේ නම් එවැනි අවස්ථාවල දී ද ඔවුන් සමන් දේවාලයට භාරහාර වෙයි. එසේම **ජන්ම පත්‍රය පරීක්ෂා කරවා ගැනීම** යනු එවැනි තවත් ඇදහිලි විශ්වාස ක්‍රමයකි. එහි දී පතලක වැඩ ඇරඹීමට ප්‍රථමව භාරහාර ආදිය සිදුකර පතලේ හිමිකරුවා තම ජන්ම පත්‍රය ජ්‍යොතිෂයවේදියකු ලවා පරීක්ෂා කරවා ගැනීම සිදුකරයි. ග්‍රහදෝෂ අනුව තමාට ධනලාභ, භූමිලාභ තිබේද යන්න පරීක්ෂා කර පතල ආරම්භය සඳහා සුභ වේලාවක් බලාගැනීම ද සිදුකරනු ඇත. තමාට යම්කිසි අපල උපද්‍රවයක් තිබේනම් ඒ සඳහා සුදුසු පූජා කර්ම කිරීම ද මෙහි අභිප්‍රේත අරමුණකි. පතල ආරම්භයේ සිට පතලේ වැඩ අවසන් වන තුරු පතල් භූමිය පසෙකින් තනන ලද මල්පැලක බුදුන්ට හා දෙවියන්ට පහන් දැල්වීම කරන අතර ආරම්භක දිනයේ පතල් සීමා ලකුණු කළ පසු සිව්කොණ සාදන ලද මල්පැල් හතරක පහන් දැල්වීම සිදුකරනු ලැබේ. මෙම ක්‍රමය **බුදුන් ප්‍රමුඛ සතර වරම් දෙවියන්ට පහන් දැල්වීම** නමින් හැඳින්වේ. මේ යටතේ ඇතැම් පළාත්වල පතලේ දෛනිකව දල්වනු ලබන පහනක් දක්නට ලැබෙන අතර එම පහන ගලකින් නිමවන ලද්දකි (මැ.ක.හා.බැ.ව, සිව්වැනි පරිච්ඡේදයඃ 38). **සාත්තර, පේන හෝ අංජනම් එළි බැලීම** මෙහි ලා තවත් එක් අභිචාර ක්‍රමයකි. අදෘශ්‍යමාන බලවේග පිළිබඳ විශ්වාස කරන අතීත මුතුන්මිත්තන් අතීතයේ සිටම අංජනම් එළි බැලීම, පේන බැලීම, සාස්තර බැලීම ආදිය සිදුකර ඇත. එසේම තමාට වෙනත් පාර්ශවයකින් සිදුවන්නා වූ හදි හූනියම්, අණවින කොඩිවිණ පිළිබඳව දැනගැනීම සඳහා ද මෙම ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙය ගුප්ත විද්‍යාවට අයත් හින්දු ආගමික බලපෑමකි. එසේම **ජ්‍යොතිෂ විද්‍යාව හා මැණික් භාවිතය** ද මෙම ඇදහිලි විශ්වාස අන්තර්ගත වූ තවත් ක්‍රමයකි. එහි දී නවග්‍රහයන් ලග්න දොළහක් ඇසුරු කරගනිමින්, පංචාංගය ද යා කෙරෙමින් ලොව මිනිසාට සලසන මෙහෙවර

අප්‍රමාණය. යම්කිසි කෙනෙකු පෙර ආත්මයේ කරන ලද කුසලාකුසල කර්ම ප්‍රතිවිපාක මත උපදින වේලාවේ ඉහත තරංග ශක්තීන් හිරු, සඳු මුල්කරගෙන ජීවිතවලට එකිනෙකට වෙනස් බලපෑම් ඇතිකරන බව දැකිය හැකිය. එසේම මෙම පර්යේෂණයේ දී විවිධ මැණික් වර්ග පළඳින අවස්ථාවන් ද විවිධය. ඒ අනුව මෙම මැණික් උපන් මාසය, ලග්නයට, සතියේ වර්ණය, ග්‍රහයින්ට පළඳින, ජය අංකයට පළඳින මෙන් ම විවිධ රෝගාබාධයන් සඳහා ද වෙන් වූ මැණික් වර්ග මෙහි ලා හඳුනාගැනීමට ලැබේ. (මැ.ක.හා.බැ.ව, සත්වැනි පරිච්ඡේදය:59,60,61,62,63). ඒ අනුව සමස්තයක් වශයෙන් සැලකූවිට මිනිස් ශ්‍රමය තුළින් රැඳී පවතින මැණික් කර්මාන්තය දැඩි පරිශ්‍රමයක්, කැපකිරීමක් කරමින් මෙම භූගත වස්තුව ලබාගැනීමේ නිරතවන බව හඳුනාගත හැකිය. එහි දී මනුෂ්‍යයන්ට විවිධ වූ කරදර, බාධක, හැලහැප්පීම්වලට මුහුණදීමට ද සිදුවුණි. මේවා තුළ ක්‍රියාත්මකවන අදෘශ්‍යමාන බලවේගයක් ඇතැයි සිතූ මෙම අහිංසක ජනතාව එම වස්තූන්ට වන්දනා කළේ ආරක්ෂාව උදෙසාය. මැණික් කර්මාන්තය හා සැබැඳුණු මෙම අභිචාර ඔවුන්ගේ චිත්ත සන්තානය තුළ පැවති භක්තිමත්භාවය හා ශ්‍රද්ධාව යන කරුණු නිසා ඇතිවූවකි. ඒ අනුව මැණික් කර්මාන්තය තුළ එයටම ආවේණික ඇදහිලි හා විශ්වාස අන්තර්ගතවන අතර, අතීත මුතුන්මිත්තන් තුළ මෙම අභිචාර ඉතා ඉහළ මට්ටමක පැවත ඇත. වර්තමානය වන විට බොහෝ පාර්ශවයන් අතර ඒවා භාවිතවන බව දක්නට ලැබේ. සුළු පාර්ශවයක් පමණක් එහි වටිනාකම අවතක්සේරුවට ලක් කරයි. මෙහි දී වර්තමානය වන තෙක් කරුණු සලකා බැලීමේ දී අනාදිමත් කාලයක සිට පැවතියා වූ මෙම මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි හා විශ්වාස විවිධ වෙනස්කම්වලට ලක් වී ඇතිබව දැකිය හැකිය. තව ද නවීන තාක්ෂණය හා වානිජකරණය හමුවේ ඈත අතීතයේ සිට පැවති මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි හා විශ්වාස තුළ යම්කිසි අඩාල වීමක් ද මෙම ක්ෂේත්‍ර ගවේෂණයේ දී හඳුනාගැනීමට හැකිවිය. ඒ අනුව ඓතිහාසික මෙන් ම කාලීන වටිනාකමක් සහිත වූ මෙම අග්‍රගණ්‍ය මැණික් කර්මාන්තය හා ඒ ආශ්‍රිතව පවතින ඇදහිලි හා විශ්වාස මැනවින් ආරක්ෂා කරගැනීම අනිවාර්යය කාර්යයක් බව මින් ප්‍රත්‍යක්ෂ කොට දක්වාලිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


රාජපක්ෂ, ශ්‍රියාණි. (2003)*මැණික් කර්මාන්තය හා බැඳි චන්පිළිවෙත්*.කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මායාදුන්නේ, සේපාලි. (2007)*මැණික් පුරාණය*.කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. (1942)*සපරගමුවේ පැරණි ලියවිලි*.කොළඹ

ප්‍රකාශකයෝ.